**ශීර්ෂය 407 - පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

1.1 **තත්ත්වාගණනය කළ මතය**

---

පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මුල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

**(අ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ පැවති 2019 වර්ෂයේ | මේ පිළිබඳව මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව වෙතින් විමසීමේදී | අමාත්‍යාංශයට අයත් නොවන දෙපාර්තමේන්තුවක |

| | | | |
|---|---|---|---|
| | සිට මෙම අමාත්‍යාංශ විෂය පථයෙන් ඉවත් වී ඇති මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අදාල රු.25,477,120 ක රැඳවුම් මුදල් 2016 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ පවතින නමුත් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | ගොඩනැගිල්ල ඉදිකිරීම නිම කර නොමැති බැවින් රඳවා ගැනීමේ මුදල් නිදහස් කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට අප වෙත උපදෙස් ලබා දීමට නොහැකි බව ප්‍රකාශ කර ඇත. | තැන්පතු මුදල් තැන්පතු ගිණුමෙන් නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | කැබ් රථ 04 ක කැනපි සවිකිරීමට 2021 දෙසැම්බර් 31 දින ලියන ලද රු.1,400,000 ක චෙක්පත 2022 අප්‍රේල් 04 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර අප්‍රේල් 08 දින එයින් රු.1,300,000 ක් අදාළ ආයතනය වෙත ගෙවා ඉතිරිය පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | සේවාවේ අවශ්‍යතාවය මත සීමිත කාලයක් තුල මෙම ප්‍රසම්පාදන කටයුතු සිදු කලද වෙළඳ පොලේ පැවති භාණ්ඩ ඌනතාවය නිසා එම කැනපි සවිකර ගැනීමට ප්‍රමාද විය. මාස 03 කුත් දින 10 ක් තුල වාහන 04 ට කැනපි සවිකිරීමෙන් පසු 2022.04.08 දින ඊට අදාළ චෙක්පත නිදහස් කරන ලදි. | මුදල් රෙගුලාසි 215(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.2 විගණන සාක්ෂි නොවීම**

-------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වටිනාකම රු.970,115 ක් වූ ගෙවීම් වවුචර් 04 කට අදාලව උපකාරක සාක්ෂි විධිමත්ව ඉදිරිපත් කර නොතිබුණි. | අඩුපාඩු සහිත උපකාරක ලියවිලි නිවැරදි කිරීමට කටයුතු කළ අතර අඩුපාඩු ඉදිරියේදී ඇති නොවන අයුරින් කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | මුදල් රෙගුලාසි 138(8) ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 4 ක සහ ප්‍රාග්ධන වැය විෂයක එකතුව රු.3,135,000 ක් වූ සම්පූර්ණ ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා මුල් මාස 06 තුල මෙම වියදම් දැරීම ප්‍රමාද වූ අතර ඉන්පසු අවසන් කාර්තුවේදී මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුව අනිවාර්ය ඉතිරිකිරීම් සිදු කල යුතු බැවින්, මෙම ප්‍රතිපාදන අනිවාර්ය ඉතිරිකිරීම් සිදුකර ඒ බැව් මහා භාණ්ඩාගාරය වෙත දන්වන ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංවර්ධන සභායන් වැඩසටහන් සඳහා රු.200,000,000ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයට අමතරව පරිපූරක මගින් රු.150,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ නමුත් පරිපූරක ඇස්තමේන්තු වටිනාකමද ඉක්මවා රු.248,547,930 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | රු.මි 200 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන විදේශ ආධාර සහිතව සනීපාරක්ෂක පහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘතිය තෙවන කාර්තුව දක්වා ක්‍රියාත්මක නොවූ අතර තෙවන කාර්තුවේදී නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව අනිවාර්ය ඉතිරිකිරීම් සේ සළකා එම ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලදි.<br>රු.මිලියන 150 ක ප්‍රතිපාදන උපයෝගී කරගෙන එළවළු ඇතිකිරීමේ හා භෝග වගා කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වූ අතර වර්ෂය අවසානයේදී ප්‍රමාණවත් අක්මුදල් නොලැබීමද හේතු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | -------------------------------------- | ------------ |
| (අ) | රු.862,191ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | බිල්පත් ප්‍රමාදව ඉදිරිපත්ව තිබූ නිසා මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් ලෙස දැක්විය නොහැකි විය. | අවසන් ගිණුම් සඳහා බැරකම් නිවැරදිව හඳුනා ගත යුතුය. |
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට පටහැනි සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 02 ක ප්‍රතිපාදන ඉක්මවා රු.6,799,194 ක බැරකම් වලට බැදී තිබුණි. | අක්මුදල් නොලැබීම නිසා රු.මිලියන 15 ක බිල්පත් එම වර්ෂයේ ගෙවීම් කිරීමට නොහැකිවීම මත බැරකම උද්ගත වී ඇත. 2020 හා 2021 වර්ෂවල ප්‍රතිපාදන යොදාගෙන මෙයින් රු.මිලියන 8.3 ක් නිරවුල් කර 2021.12.31 දිනට තවදුරටත් නිරවුල් කලයුතු ඉතිරි බැරකම රු. මිලියන 6.8 ක් වේ. | චක්‍රලේඛ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| --------------- | | | |
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| ---------------- | ------------- | -------------------------------- | ---------------- |
| 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන | මෝටර් රථයක අභ්‍යන්තර | අළුත්වැඩියාව සඳහා යොමුකළ ආයතනය විසින් | වාහන අලුත්වැඩියා |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛ අංක 30/2016 හි 4.2 ඡේදය | අලුත්වැඩියාවක් සඳහා වාහනය ගලවා වෙනත් ගරාජයක් වෙත රැගෙන යාමට නැවත සවි කිරීම වෙනුවෙන් රු.101,412 ක් පුද්ගලික සමාගමකට ගෙවා තිබුණි. | රු.3,490,517.63 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලද බැවින් මෙවැනි රථ අළුත්වැඩියාව සඳහා විශේෂ ප්‍රාගුණ්‍යයකින් යුතු වූ, වෙනත් පිළිගත් බාහිර ගරාජයකින්ද ඇස්තමේන්තුවක් ලබාගැනීම සඳහා එකලස් කළ යුතු බැවින් රු.101.402 ක් ගෙවීමට සිදුවිය. | කටයුතුවලදී චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සහ වැඩ තහනම් කළ නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ වල එකතුව රු.440,464 ක් විය. | ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කරමින් සිටින බව දන්වමි. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ ප්‍රකාරව ණය අය කර ගැනීම, ණය ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2.5 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය<br>--------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|
| 2019 සහ 2020 වර්ෂවල නිකුත් කර තිබූ රු.10,979 ක් වටිනා අස්ථානගත වූ චෙක්පත් 02 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 392 ප්‍රකාරව කටයුතු නොකර 2021 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම් පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. | අස්ථානගත වී ඇති අදාළ චෙක්පත් උචිත ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව නව චෙක්පත් නිකුත් කිරීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හැකියාවක් නොමැති නිසා එම වටිනාකම තාවකාලිකව තැන්පත් ගිණුමට මාරු කරන ලදී. අදාළ චෙක්පත් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කළ අතර හැකි ඉක්මනින් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 392 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

----------------------------------

| විගණන නිරීක්ෂණය<br>-------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|
| 2021 අගෝස්තු 31 දිනට ඉදිරිපත් වූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ඉන්දියානු රජයේ ආධාර යටතේ ඇස්තමේන්තුගත වටිනාකම | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාල මූලික අවබෝධතා ගිවිසුමක් 2018.07.19 දින සිට 2021.07.18 දක්වා අත්සන් තබා ඇත. අමාත්‍යාංශ සංශෝධනයේ ප්‍රතිඵලයක් ලෙස මෙම ව්‍යාපෘතිය පශු සම්පත්, | ක්‍රියාකාරී සැලැස්ම අනුව නියමිත කාල රාමුව තුල ව්‍යාපෘති ඉටු කර අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගත යුතුය. |

| | |
|---|---|
| රු.200,000,000 ක් වූ සනීපාරක්ෂක ඒකක 3,400 ක් මඩකලපු දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට සැලසුම් කර තිබුණද එම ඉලක්කය ළඟා කරගෙන නොතිබුණි. | ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත පසුව පවරා ඇත.<br>ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව නැවත පත් කර ඇති අතර මෙම සියලු කටයුතු අදාළ සියලු ආයතන සමග සම්බන්ධව ඔවුන්ගේ නිර්දේශයන්ට අනුකූලව සිදු කළ යුතු බැවින් ව්‍යාපෘතියේ කටයුතු සඳහා වැඩි කාලයක් ගතවන බව ද අවධානයට යොමු කරමි. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයේ කාර්යය සාධන වාර්තාවට දේශීය සුළු ආර්ථික භෝග ආශ්‍රිත අගය එකතු කළ නිෂ්පාදන ඇති කිරීමට සහාය වීම සහ අපනයනයට දිරි දීම සහ නිරෝගිමත් ජනතාවක් උදෙසා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම යන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කර නොතිබුණු අතර විටින් විට අමාත්‍යාංශයේ විෂය පථය වෙනස්වීම ද මේ කෙරෙහි සෘජුව බලපා තිබුණි. | පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය අහෝසි වූ අතර ඒ වෙනුවට 2022.04.28 දිනැති අංක 2277/53 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ග්‍රාමීය ආර්ථික භෝග වගා හා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය ලෙස කෘෂිකර්ම රේඛීය අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලදී.<br>2021 වර්ෂය සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් මෙම අමාත්‍යාංශය වෙත දේශීය අරමුදල් මගින් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු බැවින් සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොතිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු ඉටු කර ගැනීම සඳහා ඉලක්කගත කාර්යයන් සැලසුම් කළ අයුරින් ක්‍රියාවට නැංවීමට කටයුතු තළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ සිට වෙනත් ආයතන වලට ස්ථානමාරු වී ගිය නිලධාරීන් වෙත අවස්ථා 07 කදී නිකුත් කිරීම් නියෝග මත නිකුත් කර තිබුණු කාර්යාල උපකරණ අදාළ ආයතන වෙත ලද බවට ලැබීම් නියෝග මගින් තහවුරු කර නොතිබුණි. | ලැබීම් නියෝග ලබා ගැනීම සඳහා මේ වනවිට සිහිකැඳවීම් ලිපි යවා ඇත. | අමාත්‍යාංශය වෙතින් වෙනත් අංශ/නිලධාරීන් වෙත නිකුත් කළ භාණ්ඩ සම්බන්ධව ලැබීම් නියෝග මගින් තහවුරු කිරීම් ලබා ගත යුතුය. |

## 3.4 පාඩු හා හානි

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2017 වර්ෂයේ සිදු වී තිබුණු වාහන අනතුරක රු. 78,330 ක් වූ අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අවසන් වාර්තාව සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ඉදිරිපත් කර නොතිබුණි. | මෙම රථයේ අනතුර සම්බන්ධයෙන් වන මු.රෙ 104 (4) අවසන් වාර්තාව දැනට සකස් කරමින් පවතින බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නියමිත කාල වකවානුව තුළ පරීක්ෂණ පවත්වා අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 104(4) පරීක්ෂණ වාර්තාවලට අනුව වාහන අනතුරු අවස්ථා 09 ක අලාභය වූ රු.923,118 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි. | මේ වනවිට එම අලාභයන් අයකර ගැනිමට කටයුතු කරමින් සිටින බව දන්වමි. | පරීක්ෂණ වාර්තා අනුව නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

**3.5** **කළමනාකරණ දුර්වලතා**

---------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘති හඳුනා ගැනීමට ශක්‍යතා අධ්‍යනයක් මගින් ව්‍යාපෘති ඉටුකිරීමේ හැකියාව පිළිබඳව ප්‍රමාණවත් ඇගයීමක් නොකිරීම නිසා උඳු මුං සහ ඉඟුරු භෝග වගා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ දිස්ත්‍රික්ක 05 ක රු.23,538,980 ක ප්‍රතිපාදන ආපසු එවා තිබුණි. | ඇතැම් දිස්ත්‍රික්ක හරවා එවා තිබූ ප්‍රතිපාදන වැඩි ප්‍රතිලාභීන් ප්‍රමාණයක් සිටි, තවත් වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා ගැනීමට එකඟ වූ දිස්ත්‍රික්ක වෙත ලබා දී ඵලදායි ලෙස වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. | ව්‍යාපෘති සැලසුම් කිරීමේදී ව්‍යාපෘති සම්බන්ධ ශක්‍යතා අධ්‍යයනයක් කළ යුතු වේ. |

# 4. යහපාලනය

-------------------

**4.1** **අභ්‍යන්තර විගණනය**

-----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(2) (1) වන උප වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වීමේ දින | මෙම තනතුර සඳහා වන පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස අවස්ථා ගණනාවකදි රාජ්‍ය සේවා, | පනත අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සිට වසර 02 ක් නොඉක්මවන කාල සීමාවක් තුළ අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට පවතින කාර්යය මණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 15 හි ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ සහ අභ්‍යන්තර විගණක යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පැවතීම අමාත්‍යාංශයේ කාර්යය සාධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කර තිබුණි. | 2021.12.31 දිනට සේවා මට්ටම් වල පුරප්පාඩු සංඛ්‍යාව 15 කි. ඉන් ප්‍රධාන ගණකාධිකාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක , අධ්‍යක්ෂ සහ අභ්‍යන්තර විගණක යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2021.12.31 දිනට පුරප්පාඩුව පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇත. | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව තුළ බඳවාගැනීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |